සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | සිංහල සාහිත්‍ය රසාස්වාදය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I,II,III | |
| කාලය / காலம் / Time | පැය 03 | |

සැලකිය යුතුයි:
I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න.

## I කොටස

(01) අංක (i) සිට (v) තෙක් කොටස් කියවා අසා ඇති (අ, ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "මෙතැන් පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ දරුවන්ටත් බත් මාළු පිස මා දරුවන්ට ඔහු විසින් ගෙන දෙන්ට කියව."

(අ) මේ ප්‍රකාශය කවුරු කියූවක් ද?

(ආ) මෙහි "ඔහු" යනුවෙන් නම් කළේ කවුරුන් ද?

(ii) මිනිහා වෙතින් මිනිහා වෙත් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

(අ) මෙහි පැවසෙන අදහස කෙටියෙන් දක්වන්න.

(ආ) මේ කවිය ඇතුළත් කවි පන්තිය රචනා කළේ කවුරුන් ද?

(iii) "මම අලවමින් සිටි කඩදාසි කැබැල්ල පසකින් තබා නහය රැළි ගස්වා "හරි ගඳයි" කීවෙමි."

(අ) මෙසේ කීවේ කාට ද?

(ආ) මේ කතාව නිර්මාණය කළේ කවුරුන් ද?

(iv) කුරිරු ගොර සපුන්ගේ දළ'ගෙහි විසය
මදුරු මැසි කැලන්ගේ තුඩ'ගෙහි විසය

(අ) මෙම කවිය සම්පූර්ණ කරන්න.

(ආ) මෙම කවිය උපුටාගත් ග්‍රන්ථය කුමක් ද?

(v) "මෙහි සරස්වතී දේවිය හැටියට පෙනී සිටීමට ගුණපාල තෝරා ගන්නා ලදී."

(අ) මෙම කොටස උපුටාගත් කතාව කුමක් ද?

(ආ) මෙම කතාවේ රචකයාගේ වෙනත් නිර්මාණයක් නම් කරන්න.

(ලකුණු 04 x 05 = 20යි)

(02) පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොටගෙන රසාස්වාදයක් ලියන්න.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුරන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ වේ
රන්වන් කරල් බරවී දැන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳගෙන වියළි දර

දර ටික තබා සෙවණැති පදු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරු ම සිට පෙන් වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්විය මට සොම්නස පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකු යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී

(i) කවි පන්තියෙන් කවියා ඉදිරිපත් කරන වස්තු විෂය කුමක් ද?

(ii) ඒ සඳහා යොදාගත් ස්වභාවෝක්ති අලංකාරය කොතෙක් දුරට ගැළපේ ද?

(iii) කවි පෙළෙන් නිරූපිත සමාජය කවියාගේ කවීත්වයට බලපා ඇත්තේ කෙසේ ද?

(iv) කවියා ඉදිරිපත් කරන අත්දැකීම් රසවත් ව ප්‍රකාශ කර ඇති ආකාරය කෙතරම් දුරට උචිත වන්නේ ද?

(v) කවි පෙළ සාර්ථකවීමට කවියා යොදාගත් දෘෂ්ටිකෝණය කෙතෙක් දුරට ගැළපෙන්නේ දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 25)

## II කොටස

(03) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

එතැන් පටන් දැකුමුත් නැතිව අරක්කැමිකම් කරමින් දඹු මුසු සීල් බත් කමින් බත් නිවන ඔරුව පිට සයනය කෙරෙමින් දර පළමින් පැන් ගෙනෙමින් වළන් සෝදමින් උදෑසන කැඳ අවුළු දාවල බත් මාළු අවුළු පිසගෙන ගොස් කවමින් පොවමින් මධුරාන්නපාන සයන වස්ත්‍රාභරණාදියක් නැතිව කාමාතෘෂ්ණානු රාගයෙන් බැඳී බොහෝ දුක් විඳිමින් එක් දවසක් මුළුතැන්ගෙය මිදුලෙන් යන්නා වූ කුද දැක, කැඳවා ප්‍රභාවතී කෙරෙහි හයින් නොඇසුකන්ව යුහුව යන සඳ වහා ගොස් සාමිදුව මෙන් තදව ගියාහු ය. මෙතෙක් දවස් මුළුල්ලෙහි තොප හැම සමීපයෙහි වැස සුව දුක් විචාරීම් විවරකුත් නොලදුම් හ. සෙසු ලාභයෙක් කැළම වේද, එතකුදු වුවත් ප්‍රභාවතීන්ගේ තද මන් අරවා දක්වා ලිය එව් දැ'යි විචාළා. ඒ අසා කුදිත් "යහපතැ" යි කිව.

(i) මේ උද්ධෘත ඇසුරින් කුස චරිතය පිළිබඳව ඔබට හැඟෙන හැඟීම විස්තර කරන්න. (ලකුණු 05)

(ii) මේ කොටස ඔබේ සිත තුළ මවන චිත්තරූපය කෙබඳු දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ජාතක කතාකරු යොදාගත් භාෂාව මෙහි කතාව පාඨකයාට සමීප කිරීමට කෙතරම් දුරට ඉවහල් වූයේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) කුස රාජ චරිතය කෙබඳු දැයි කතාකරු පෙන්වා දුන් ආකාරය උද්ධෘත ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

නැතහොත්,

හිස නමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවා ගති
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය

දැල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළි ගෙන අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඈ
වුවමනාවකින් කිසිත් නැතිව ද
නො රැඳෙයි, පලා යෙයි

ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දැනෙන්නේ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන

(i) කවියා මෙහි චිත්තරූප මැවූ සිතුවිල්ල වාක්‍යයකින් ලියා දක්වන්න. (ලකුණු 05)

(ii) කවි පන්තියට අපූරු බවක් ගෙන දීමට භාෂාව කෙතරම් දුරට ඉවහල් කරගෙන ඇත් ද? (ලකුණු 05)

(iii) කවියේ ආකෘතිය හෙවත් කවියා යොදාගත් ශිල්පීය දක්ෂතා අත්දැකීම අර්ථවත් කිරීමට කෙතෙක් දුරට හේතු වී ඇත් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) කවියා සතු ප්‍රතිභාව මෙ පැදිපෙළින් කෙතරම් දුරට සාර්ථකව ඉදිරිපත් වේ දැයි විමසන්න. (ලකුණු 10)

## III කොටස

**මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න.**
**(එක් උත්තරයක වචන 150ක්වත් තිබිය යුතු ය.)**

(04) ''කුස ජාතකයෙහි සජීවී සිතුවම් මවමින් රචනා කිරීමට යොදාගත් භාෂාව එහි රසවත් බවට හේතුවකි.'' නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 15)

(05) ''තුම්මංහන්දිය නවකතාව උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් රචනා කිරීම නිසා රසවත් කතාවක් විය.'' නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(06) ''පොදු ජනතාවට යහපත අයහපත පිළිබඳ හැඟුමන් ඇතිකරවමින් ජීවිතය සාර්ථක කරගැනීමට හැකිවන අයුරින් සුභාෂිතය රචනා වී ඇත.'' නිදසුන් තුනක් වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(07) ''සමාජයේ පවතින ප්‍රශ්නයක් වස්තු විෂය කර ගැනීම නිසා "උතුරෙන්" පද්‍ය පන්තිය පාඨකයාට ආදර්ශයක් සපයයි.'' කවි පෙළෙන් නිදසුන් තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(ලකුණු 15 x 2 = 30)